රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 06/2016

මගේ අංකය : CS/SLAS/AMEN/MINUT(III වෙළුම)
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2016 මාර්තු මස 17 වෙනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,

<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ **III** වන ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන්</u>
<u>රාජ්‍ය භාෂා දෙමළ ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 07/2007 බලාත්මක වන දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් උක්ත චක්‍රලේඛයේ විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාවය ලබා ගත යුතු බැවින්, 2007.07.01 දින සිට 2012.01.02 දින දක්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් (උදා: 2007 සීමිත, 2009 විවෘත, 2010 සීමිත, 2010 විවෘත, ආදී) ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි සඳහන් වන අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව දන්වමි.

02 දැනටමත් 2007.07.01 දින සිට 2012.01.02 දින දක්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද, පත්වීම් ලිපියෙහි සඳහන් වන අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත දිනට සම්පූර්ණ නොකිරීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතීන්හි 111 වගන්තිය යටතේ පරිවාස කාලය දීර්ඝ කර පත්වීම ස්ථිර කරන ලද නිලධාරීන් වේ නම්, එම පරිවාස කාලය දීර්ඝ කිරීම සංශෝධනය සඳහා අදාල ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම පිණිස මෙම අමාත්‍යාංශයට යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

03 මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව වේ.

ජේ. දඩල්ලගේ
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය